www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මැද පෙරදිග කලාපය තුල ඔබාමාගේ රාජ්‍යතාන්ත්‍රික වැටලීම

## Obama's diplomatic offensive in the Middle East

**2009 අගෝස්තු 01**

**ජෝන් ෂෝල් විසිනි**

**ස**ාම ධූත මෙහෙවරක් ලෙස හැඩගන්වා ඇති මැද පෙරදිග කලාපයේ ජානාධිපති බරක් ඔබාමාගේ රාජ්‍යතාන්ත්‍රික වැටලීමේ අරමුන, සිය භූ මූලෝපායික අවශ්‍යතා සඳහා බලපෑම් කිරීමේ වොෂින්ටනයේ ආස්ථානය යලි පිහිටුවාගැනීමයි.

ඔබාමා පරිපාලනය, සිරියාව සමග සබඳතා වර්ධනය කර ගැනීමටත්, කලාපය තුල වැඩෙන ඉරාන බලපෑමට වල කැපීමටත්, දුබල හා කප්පාදු කල පලස්තීනයක් ස්ථාපනය කිරීමේ උත්සාහයක නිරතවෙයි. අරාබි රාජ්‍යයන් විසින් ප්‍රතිග්‍රහනය කල රාජ්‍ය කැබැල්ලක් පිලිගැනීමටත්, ජනාවාස පුලුල් කිරීම අත්හිටුවීමටත්, සිය ප්‍රධාන සගයා වන ඊස්රායලයේ එකගත්වය ලබාගැනීම, මෙම අරමුනු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය කෙරෙයි. කෙසේ වෙතත් ඊස්රායල් අගමැති බෙන්ජමින් නෙතන්යාහු නායකත්වය දරන්නේ සමහර විට එරට ඉතිහාසයේ අතිශයින්ම දක්ෂිනාංශික ආන්ඩුවේ වන අතර, සිරියාවට හෝ ඉරානයට කිසිදු සහනයක් දීමට මෙන්ම ඉහත කී අරමුනු වලට තරයේම විරුද්ධත්වය දක්වන අන්ත ජාතිකවාදී ජනපදිකයන්ගේ හා අන්ත දක්ෂිනාංශික පක්ෂ මත දේශපාලනිකව රැඳී සිටිමිනි.

ජ්‍යෙෂ්ඨ එක්සත් ජනපද නිලධාරීන් සිව් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් පසුගිය සතිය තුල ඊස්රායලයේ සංචාරය කලහ. ඊස්රායල්-පලස්තීන සබඳතාවයේ විශේෂ නියෝජිත ජොර්ජ් මිචෙල්, සිරියාව, ඊජිප්තුව, රමල්ලා හා බහරේන් වෙත ද ගියේය. ජාතික ආරක්ෂක උපදේශක ජේම්ස් ජෝන්ස්, ජාතික ආරක්ෂක කමිටුවේ මැද පෙරදිග ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂක හා පර්සියන් ගල්ෆ්හි විශේෂ උපදේශක ඩෙනිස් රොස් හා ජෝර්දානයේ හා ඉරාකයේ ද සංචාරය කල රොබට් ගේට්ස් ද ඒ අතර වූහ.

ඊස්රායලය මත කොන්දේසි පැටවීමෙහි ලා ඔවුන්ගේ සාර්ථකත්වය සීමිත විය.

ඊස්රායලයේ විදේශ ලේකම් වන ෆැසිස්ට් හුරුවක් ඇති ඊස්රායෙල් බීටිනූ හි ඇවිග්ඩර් ලිබර්මන් ඔබාමා පරිපාලනයට පිලිගත හැකි පුද්ගලයෙක් නොවේ. සාකච්ඡාවල දී ඊස්රායල් පාර්ශවයට නායකත්වය දීම සඳහා ආරක්ෂක ලේකම් ඒහුඩ් බරාක්ට ඉඩ සැලසීම් වස් හෙතෙම, දස දින ලතින් ඇමරිකානු සංචාරයක් සඳහා පිටත්කර හැර තිබුනි.

කිසිදු පාර්ශවයක උපදේශකයන් හා ලේකම් වරුන් රහිතව ජුලි 27 වන දින මිචෙල්, නෙතන්යාහු සමග පැය දෙක හමාරක් තිස්සේ සාකච්ඡා කලේය. රැස්වීමෙන් පසුව, ජනාවාස ඉදිකිරීම අත්හිටුවීම සම්බන්ධව ඊස්රායලයේ එකගතාවක් ගැන කිසිදු සඳහනක් නොවීය. ජනාවාසයන්හි "ස්වාභාවික වර්ධනයට" ඉඩහල යුතු යයි කියා සිටිමින් නෙතන්යාහු මුලින් එවැනි අත්හිටුවීමක් ප්‍රතික්ෂේප කොට තිබුනි. අරාබි නැගෙනහිර ජෙරුසලමේ ඉදිකිරීම් වල කිසිදු අත්හිටුවීමකට ද ඔහු විරෝධය පල කොට තිබුනි.

මිචෙල් ඊස්රායලයෙන් නික්ම ගොස් දෙදිනකට පසුව නෙතන්යාහු, නැගෙනහිර ජෙරුසලමේ එකම ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවා ඇති බව වාර්තා විය.

මේ වසර අවසානයේ සාකච්ඡා යලි

ඇරඹීමේ වෑයමක නිරත වෙමින් මිචෙල්, එක්සත් ජනපදයේ පිටුබලය ලබන, පලස්තීන අධිකාරියේ ෆටා ජනාධිපති මොහමඩ් අබ්බාස් මුන ගැසීමට රමල්ලාවට ද ගියේය. ෆටා සංවිධානය ගැටුම් වලින් භේද භින්නව ඇති අතර, අබ්බාස්ට ඇත්තේ තුනී මහජන සහයෝගයකි. මෙම මස මුලදී පිටුවහලේ සිටින කෘතහස්ත ෆටා නායක ෆරූක් අල් කදූමි, 2004 නොවැම්බරයේ හඳුනා නොගත් සාධක හේතු කොට ගෙන මරනයට පත් යසර් අරෆත්ට වස දීම සඳහා අබ්බාස්, එක්සත් ජනපදය හා ඊස්රායලය සමඟ කුමන්ත්‍රනයක යෙදී සිටි බවට චෝදනා කලේය.

ඊස්රායලය විසින් පාලනය කරන මීටර් අටක් උසැති තාප්පයක් පටුපස සිරකරන ලද එකිනෙකින් වෙන්වූ කොටස් ගනනාවකින් සමන්විත ගාසා හා බටහිර ඉවුර වශයෙන් දෙකඩ කරන ලද පලස්තීනයක් හැරෙන්නට, අන් කිසිවක් පිරිනොනැමෙන බව ඔබාමා විසින් පැහැදිලිකර ඇත.

ගාසාව පාලනය කරන හමාස් සමඟ බටහිර ඉවුර පාලනය කරන ෆටා සංවිධානය කටුක බල අරගලයක පැටලී සිටියි. බටහිර ඉවුරේ සැබෑ බලවතා වන එක්සත් ජනපදයේ කර්නල් කීත් ඩේටන් ගේ අධීක්ෂනය යටතේ හමාස් සංවිධානය කුරිරු ලෙස මැඩීම මත ඔට්ටුතබා සිටින අබ්බාස්ට මුදල් ආධාර පිරිනමමින් වසර ගනනාවක් තිස්සේ වොෂින්ටනය හා ඊස්රායලය පලස්තීනයේ දේශපාලන බෙදීම් ගැඹුරු කිරීමට කටයුතු කර ඇත. ගාසාවේ ෆටා වරුනට එරෙහිව එකට එක කිරීම් සිදුවන අතර වාරයේ, 1000 කට වැඩි හමාස් ක්‍රියාකාරීන් නඩු විභාග නොමැතිව බටහිර ඉවුරෙහි සිරකොට ඇති අතර, ඝාතන, වධදීම් හා හමාස් ශුභසාධන මධ්‍යස්ථාන හා පහසුකම් ආක්‍රමනය කිරීම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ.

අල් හක් යන පලස්තීන මානව හිමිකම් සංවිධානයේ රාබි ලටීෆා ඉන්ටර් ප්‍රෙස් සර්විස් මාධ්‍ය ආයතනයට ප්‍රකාශ කලේ "පලස්තීනය තුල අපට පොලිස් රාජ්‍යයන් එකක් නොව දෙකක්ම ඇත. එකක් ගාසාවේ හා අනික බටහිර ඉවුරේ ය. මේ තත්ත්වය දිගට පැවතුන හොත් පලස්තීන ප්‍රදේශ දෙක තුලම ඒවායේ ආන්ඩුවලට එරෙහිව මහජන නැගිටීම් ඇතිවිය හැකිය." යනුවෙනි.

මසක් තුල සිය දෙවන සංචාරය සඳහා මිචෙල්, නෙතන්යාහු හමුවීමට පෙර, සිරියාවට ගියේය. ඉරානය හුදෙකලා කර, ඊස්රායලය හා ලෙබනනය අතර සබඳතා සාමාන්‍ය තත්ත්වයට පත්කොට, සිරියාවේ මිතුරන් වන ලෙබනනයේ හෙස්බොල්ලාවරු හා ගාසාවේ හමාස්වරුන්ට ලැබෙන සහාය නතර කිරීම සඳහා ඊස්රායලය හා සිරියාව අතර එකඟතාවක් සඳහා කපුකම් කිරීමට ඔහු වෑයම් කරමින් සිටියි.

ජූනි මාසයේ ලෙබනන් මැතිවරනවල දී හෙස්බොල්ලා වරුන්ට හා සිරියානු හිතවාදී සභාගයට එරෙහිව එක්සත් ජනපද සන්ධානයට තුනී බහුතරයක් ලැබීමෙන් කිහිප දිනකට පසුව මිචෙල්, සිරියාව සමඟ සාකච්ඡා ආරම්භ කලේය. ඉන් දින කිපයකට පෙර හිටපු ජනාධිපති ජිමී කාටර් සිරියානු ජනාධිපති බෂීර් අසාඩ් හා හමාස් නායකයන් ඩැමස්කස් හි දී හමු විය.

කලාපීය සාම භූමිකාව තුල සිරියාව, "අවියෝජනීය" ක්‍රියාකලාපයක් ඉටු කරන බව මිචෙල් පැවසීය. ජූනි මාසයේ ඔබාමාගේ මැද පෙරදිග සංචාරයෙන් පසුව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව නිවේදනය කලේ, හෙතෙම 2005 දී සිදුවූ හිටපු ලෙබනන් අගමැති රාෆික් හරීරිගේ ඝාතනයෙන් පසුව ප්‍රථම වතාවට, ඩැමස්කස් වෙත තානාපති වරයෙකු පිටත්කර හරින බවයි. එක්සත් ජනපදය සිරියාව මත ඝාතනයේ වගකීම පටවා තිබුන ද, එක්සත් ජාතීන්ගේ පරීක්ෂනයෙන් එම චෝදනා ඔප්පු කිරීමට තරම් සාක්ෂි සොයා නොගත් අතර සිරියානු හිතවාදී ලෙබනන් ජෙනරාල් වරු සිව්දෙනා මැයි මාසයේදී නිදහස් කරනු ලැබිනි.

1967 යුද්ධයේදී ඊස්රායලය අල්ලාගත් ගෝලාන් කඳුකර ප්‍රදේශය යලි බාරදීම මුල්කොටගත් සිරියා-ඊස්රායල් සාකච්ඡා,

ටිබරීස් වැවට සිරියාවේ ප්‍රවේශය ඊශ්‍රායලය විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව 2000 වසරේ මුල, බිඳ වැටුනි. එතැන් පටන් ගෝලාන් වෙතින් ඉවත්වීම හා සිරියා-ඊශ්‍රායල සබඳතා යථා තත්ත්වයට ගෙනඒමේ උත්සාහය පිරිහී තිබේ.

ඕනෑම ගිවිසුමක් පිලිබඳව සිරියාවට, ගෝලාන් යලි ලබා ගැනීම තීරනාත්මකය. ඊට අමතරව, නොඑකඟතාවන් ගනනාවක් තිබියදී ද 2006 දී ඉරානය සමඟ යථාවත් කරගත් අන්‍යොන්‍ය ආරක්ෂක ගිවිසුම ද ආර්ථික හා සංස්කෘතික බැඳීම් ද අඩාල කර ගැනීමට සිරියාව කැමැත්තක් නොදක්වයි. ත්‍රස්තවාදයට අනුග්‍රහය දක්වන රාජ්‍ය ලැයිස්තුවෙන් තම රටෙහි නම ඉවත්කර ගැනීමට ද එක්සත් ජනපදයේ ආර්ථික සම්බාධක ඉවත්කර ගැනීමට ද බටහිර හා අරාබි රාජ්‍යයන් සමඟ නව ආර්ථික හා දේශපාලන සබඳතා යලි ගොඩනඟා ගැනීමට ද සිරියාව බලාපොරොත්තු වෙයි.

සිරියාව සමඟ කිසියම් ආකාරයක මිත්‍රත්වයක් ගොඩනඟා ගැනීමට ඔබාමා කැමැත්තක් දක්වන නමුදු, වඩාත් කලහකාරී කොටස් අඛන්ඩ ආර්ථික සම්බාධක, හරීරි ඝාතන පරීක්ෂන දිගටම ගෙනයාම හා අල් කිබා හි ජාත්‍යන්තර පරමානුක බලශක්ති ආයතනය විසින් පුලුල් ලෙස සොයාබැලීම අවශ්‍ය බව කියා සිටිති. සිරියාව පරමානු බලාගාරයක් ඉදිකරන්නේ යයි කියා සිටිමින් ඊශ්‍රායලය, 2007 සැප්තැම්බරයේ දී අල් කිබා අසල සිරියානු මිලිටරි සංකීර්නයට බෝම්බ හෙලීය.

ඩැමස්කස්හි සිටින හමාස් නායක කාලඩ් මෙෂාල් 1967 ට පූර්වයෙන් පැවති දේශසීමා සහිත පලස්තීන රාජ්‍යයක් පිලිබඳ අදහස පිලිගෙන ඇති තත්ත්වයේදී මේතාක් දුරට වොෂින්ටනය, තෝරා පත්කරගත් හමාස් ආන්ඩුව සමඟ ප්‍රසිද්ධියේ ගනුදෙනු කිරීම ප්‍රතික්ෂේප කර ඇති නමුදු, ඊජිප්තුවේ දී මිචෙල්, ෆටා හා හමාස් අතර සම්මුතියක් ඇතිකරවීම සඳහා කපුකම් කලේය.

2002 අරාබි සාම සැලැස්ම ඊජිප්තුව ලවා සංශෝධනය කරවීමට ද වොෂින්ටනය වැයම් කරන නමුත්, මෙයට අරාබි සංගමය එකඟ කරවා ගැනීමට ඊජිප්තුවට හැකිවී නැත. සැලැස්මෙන් ඉල්ලා ඇත්තේ, අරාබි ලෝකය සමඟ සබඳතා යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා, බටහිර ඉවුරේ, ගාසාවේ හා නැගෙනහිර ජෙරුසලමේ පලස්තීන රාජ්‍යය ස්ථාපිත කල යුතු බවත්, ඊශ්‍රායලය 1967 දේශසීමාවන් කරා පසු බැසිය යුතු බවත්, ඊශ්‍රායලය තුල ඇති සිය වාසස්ථාන කරා යලි පැමිනීමේ පලස්තීනුවන් සතු අයිතිය පිලිගැනීම හෝ එයට හිලව් වශයෙන් වන්දි ගෙවීමත් සිදුකල යුතු බවයි. එහෙත් මේ කිසිදු කොන්දේසියක් පිලිගැනීමට ඊශ්‍රායලය සූදානම් නැත.

ඔබාමා විසින් බුෂ්ගේ කැබිනට් මන්ඩලයෙන් පවරාගත් එක්සත් ජනපද ආරක්ෂක ලේකම් රොබට් ගේට්ස් ද, ඉරානය සමඟ සබඳතා, එක්සත් ජනපද රාජ්‍ය තාන්ත්‍රික මෙහෙයුම් හා ඒකාබද්ධ මිලිටරි ප්‍රශ්න පිලිබඳව සාකච්ඡා කිරීමට නෙතන්යාහු හා බරාක් හමුවිය.

එක්සත් ජනපදය මෙන්ම ඊශ්‍රායලය ද කියා සිටින්නේ වසරක් හා වසර තුනක් ඇතුලත ඉරානයට න්‍යෂ්ටික ආයුධ අත්කර ගැනීමේ හැකියාව ඇති බවයි. සාකච්ඡා පිලිබඳ යෝජනාව පිලිගැනීමට සැප්තැම්බර් අග දක්වා ද න්‍යෂ්ටික ප්‍රශ්නය පිලිබඳ යම් ප්‍රගතියක් පෙන්වීමට වසර අවසානය දක්වා ද කල් ලබාදෙන බව ඔබාමා ඉරානයට දන්වා ඇත. අනෙක් අතට ඊශ්‍රායලය, කල්තියා හා ක්ෂනිකව ඉරානයේ න්‍යෂ්ටික මධ්‍යස්ථාන වලට ප්‍රහාර එල්ල කිරීමට කැමැත්ත දක්වන අතර, 1981 දී ඉරාකයට එල්ල කල ආකාරයට, තමන් ප්‍රහාර සඳහා සූදානමින් සිටින බව යලි යලිත් කියා ඇත.

ගේට්ස් හා ඒකාබද්ධ ප්‍රධාන කාර්ය මන්ඩලයේ සභාපති මයික් මුලන් ඇතුලු ප්‍රධාන පෙන්ටගන් නිලධාරීන් යලි යලිත් පවසා ඇත්තේ, ඊශ්‍රායලය ඉරානයට එල්ල කරන ප්‍රහාරයක්, කලාපය අස්ථාවර කර පුලුල් ගැටුමක් ඉක්මන් කරනු ඇති බවයි. ඉරාන

විප්ලවකාරී හමුදාවේ ප්‍රධානී ජෙනරාල් මොහමඩ් අලි ජෆාරි පසුගිය සතියේ අනතුරු ඇඟවූයේ කුමන හෝ ප්‍රහාරයකට ඉරානය ප්‍රතිචාර දක්වනු ඇති බවයි. "අපගේ රොකට්ටු ඊස්රායලයේ සියලු න්‍යෂ්ටික මධ්‍යස්ථාන ඉලක්ක කිරීමට තරම් නිවැරදි වන්නේය."

සති කිහිපයකට පෙර, උප ජනාධිපති ජෝසෆ් බිඩෙන් අවධාරනයෙන් කියා සිටියේ එක්සත් ජනපදයට, මිලිටරි ක්‍රියාවන් පිලිබඳව ඊස්රායලයේ තීරන මත "අන පැනවිය" නොහැකි බවය. එහෙත් එවැනි ප්‍රකාශයක් පැහැදිලිව ම අභූත සහගතය. මන්ද යත්, එක්සත් ජනපදය පාලනය කරන ඉරාක ගුවන් පථයට ඉහලින් පියාසර කිරීමට ඊස්රායලයට අවසරයක් අවශ්‍ය වීමත් මූල්‍යමය, මිලිටරිමය හා දේශපාලනික වශයෙන් ඊස්රායලය මුලුමනින්ම යැපෙන්නේ එක්සත් ජනපදය මත වීමත්, නිසාය.

එක්සත් ජනපදයට ඊස්රායලය මත "අන පැනවිය" නොහැකි නමුදු, කුමක් කල යුතු ද කුමක් නොකල යුතු ද යන්න පිලිබඳව වොෂින්ටනය වෙනත් වඩා විශාල ජාතීන්ට අනදීම පුරුද්දක් කරගෙන සිටියි. එසේ වී ඇත්තේ, ඔබාමා පරිපාලනයට අවශ්‍ය වන්නේ සිය විදේශ පිලිවෙතේ හුදු නාමික මාරුවක් පමනක් වීම නිසාය. එහෙත් ඊශ්‍රායලය කොතෙක් දුර තල්ලු කල යුතු ද යන්න ගැන එය, දේශපාලනිකව බෙදී ඇත. තවද සෑම විටම මෙන්ම මෙහිදී ද එක්සත් ජනපද විදෙස් පිලිවෙතේ අරමුනු පිලිබඳව රිපබ්ලිකානු එකඟත්වය ලබාගැනීමට ඔබාමා අධිෂ්ඨානවත්ව සිටියි.

සියලු මූලික කරුනු සැලකිල්ලට ගන්නා කල එක්සත් ජනපදය සිටින්නේ දැඩි ලෙසම ඊස්රායලය සමඟ බැඳීගෙනය. එබැවින් එක්සත් ජනපදය ප්‍රහාරයක් සඳහා ඊස්රායලයට "කිසි සේත්ම අනුමැතිය නොදෙන" බව ඔබාමා සීඑන්එන් වෙත ප්‍රකාශ කරන අතර, ඊස්රායලයට දෙන එක්සත් ජනපද මිලිටරි සහායෝගයේ කිසිදු අඩුවක් සිදු නොවන බවට ගේට්ස් පොරොන්දු දෙයි. "ඊස්රායලයට සිය ජාතික ආරක්ෂාව සඳහා අති නවීන අවි ලැබෙන බවට අප දිගටම වග බලා ගන්නෙමු" යයි ඔහු පැවසීය.

ඊස්රායලය සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ගේට්ස්, ජෝර්දානය වෙත ගිය අතර එහිදී ඔහු කියා සිටියේ, සහයෝගිතාවයේ වොෂින්ටන් ඇරයුම ටෙහෙරානය විසින් ප්‍රතික්ෂේප කලහොත් එක්සත් ජනපදය වඩාත් දැඩි, එක්සත් ජාතීන්ගේ සම්බාධක සඳහා යොමුවනු ඇති බවයි.

ඉරානයට එරෙහි ඊස්රායල් ප්‍රහාර නෙතන්යාහු විසින් බැහැර නොකලේය. "ඉරානයේ න්‍යෂ්ටික තර්ජනය සම්බන්ධයෙන් එක්සත් ජනපදය හා ඊස්රායලය මුහුනට මුහුන ලා සිටින බව ගේට්ස් ප්‍රකාශ කලා. ඉරානයේ න්‍යෂ්ටික අභිප්‍රායන් හා එය න්‍යෂ්ටික අවි තැනීමේ හැකියාව අත්කර ගැනීම වැලැක්වීමේලා පවතින සියලු මාධ්‍යයන් ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවය ඊස්රායලය බැරෑරුම් ලෙස සලකන බව මා යලිත් කිව යුතුයයි" ඔහු පැවසීය.

© www.wsws.org